මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/105** **2024.09.21**

# ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## ඡන්දය සලකුණු කිරීමේ දී කාබන් පෑන සහ පැන්සල භාවිතා කිරීම පිළිගන්නා බව

ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී ඡන්දය සලකුණු කිරීම සඳහා සෑම ඡන්ද මධ්‍යස්ථානයක් සඳහාම කාබන් පෑන් සපයා ඇත. එසේ වුවද සමහර ඡන්ද මධ්‍යස්ථානවල දී මීට පෙර ඡන්ද විමසීම්වල දී ඡන්දය සලකුණු කිරීමට භාවිතා කළ ආකාරයෙන් පැන්සල ද භාවිතා වන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇත. එම මධ්‍යස්ථානවලද කාබන් පෑන භාවිතා කරන ලෙස මේ වන විටත් උපදෙස් ලබා දී ඇත.

කෙසේ වුවද ඡන්දය සලකුණු කිරීම සඳහා කාබන් පෑන වෙනුවට පැන්සල භාවිතා කරන ලද කිසිඳු ඡන්ද පත්‍රිකාවක් අවලංගු නොවන අතර ඒ සම්බන්ධයෙන් කිසිඳු සැක සංකාවක් ඇති කර නොගන්නා මෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්දදායකයින් වෙත දැනුම් දෙනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)